**මොරටුව විශ්වවිද්‍යාලය - 2010**

-----------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මතය**

-----

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව , මොරටුව විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවතවා ඇති බවත් , මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර , 2010 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවත් , මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-------------------------------------

1.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අභියෝගිතා පරීක්ෂණ ආදායම් හා වියදම් ගැලපීමෙන් පසු අතිරික්තය වූ රු.1,820,610 ක් වර්ෂයේ ආදායමක් ලෙස දක්වනු වෙනුවට විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) පාඨමාලා 50 ක් හා ව්‍යාපෘති 04 ක් හා වැඩමළු 07 ක් අවසානයේ ඉතිරි වූ රු. 10,307,523 ක අතිරික්තය ඒ ඒ වර්ෂවල ආදායම් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත් , විලම්භිත ආදායම් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) 2003 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වූ වර්ෂ 06 කට අදාලව නිලධාරීන් විසින් ඉල්ලුම් නොකල රු.272,524 ක වේතන නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයට සිදුවන අලාභ සහ හානි වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ශිෂ්‍යයන්ගෙන් අයකර ගත් රු.528,246 ක් ආදායම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ශේෂපත්‍රයේ බැරකමක් ලෙස දක්වා තිබුණි.

(ඉ) 2010 වර්ෂය තුල ආයෝජනය කරන ලද රු.6,000,000 ක ස්ථාවර තැන්පතු වලින් ලැබිය යුතු රු.360,835 ක් වූ පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයේදී ලංකා බැංකුවේ ජංගම ගිණුමෙහි රු.3,666,664 ක් වූ සෘජු බැරකිරීම් හා රු.5,150 ක් වූ සෘජු හර කිරීම් හදුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි .

(උ) 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලය තුළ අබලි භාණ්ඩ විකිණීමෙන් ලද රු.2,391,311 ක මුදල එම භාණ්ඩවල පිරිවැය අදාල ගිණුමට ගලපා එහි ලාභය හෝ අලාභය ආදායම් වියදම් ගිණුමට වාර්ෂිකව ගැලපීමට කටයුතු නොකර ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයේදී ශිෂ්‍ය බැංකු තැන්පත් අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.170,651 ක් වූ අතර එය හදුනාගෙන ගැලපීම් කරනු වෙනුවට ජංගම බැරකමක් ලෙස මූල්‍ය ප්‍රකාශණවල දක්වා තිබුණි.

1.2.2 **නොසැසදීම්**

--------------

පොදු ලෙජරයේ ජනිත කළ ප්‍රාගධන අරමුදල් ගිණුම අනුව 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.226,529,338 ක් වුවද , එදිනට ශේෂ පත්‍රය අනුව එම ශේෂය රු.226,719,100 ක් ලෙස දැක්වීම හේතුවෙන් එම ශේෂ අතර රු.189,762 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.2.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිලධාරීන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු ආපදා ණය රු.468,030 ක්ද , නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු මාණ්ඩලික ණය රු.40,086 ක්ද , නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වාහන ණය රු.37,400 ක් සහ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු පරිගණක ණය රු.25,500 ක් වසර 06 ක සිට හිඟව පවතින අතර ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ ශේෂයක් නොතිබුණු , නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවීමට තිබූ රු.4,433,752 ක ගිවිසුම් කඩකිරීම්ද, රු.95,850 ක ණය මුදල්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ගිවිසුම් හා බැදුම්කර කඩකළ නිලධාරීන් 28 දෙනෙකුගෙන් අයවිය යුතු රු.29,083,664 ක් වූ ගිවිසුම් කඩකිරීමේ වන්දිද , රු.796,339 ක ණය මුදල් ද , ඔවුන්ගේ විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලින් අයකර ගැනීමට හා ඉතිරිය ඔවුන්ගෙන් පෞද්ගලිකව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඉහත නිළධාරීන් 14 දෙනෙකුගෙන් අයවිය යුතු මුදලින් රු.2,652,112 ක් විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලින් අයකර ගැනීමට අදාල නිලධාරීන් විසින් අනුමැතිය දී තිබුණද 2010 දෙසැම්බර් 31 වන විටත් එම මුදල් අයකරගෙන නොතිබුණි.

(ඈ) මොරටුව විශ්වවිද්‍යාලයේ ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා 2006 වර්ෂයට පෙර සිට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් අයවීමට තිබෙන රු.4,435,700 ක් වූ ණයගැති ශේෂය මේ දක්වා අයකරගෙන නොතිබුණි.

(ඉ) ජාතික විද්‍යා පදනම මගින් අනුග්‍රහය දැක්වූ පර්යේෂණ 09 කට ලබාදුන් රු.1,051,647 ක ශේෂයක් නොවෙනස්ව වර්ෂ 02 සිට වර්ෂ 06 දක්වා කාලයක් විශ්වවිද්‍යාලයේ ජංගම බැරකම් යටතේ පවතින අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) වෙනත් ආයතන මගින් අනුග්‍රහය දක්වා ඇති පර්යේෂණ 08 ක් වෙනුවෙන් ලබාදී ඇති රු.2,253,144 ක ශේෂයක් වර්ෂ 03 ක කාලයක් තුල නොවෙනස්ව ජංගම බැරකම් යටතේ පවතින අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.2.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

----------------------------------

සමාලෝචිත වර්ෂයේ දක්වා තිබූ පහත වටිනාකම් තහවුරු වන විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවූ නිසා එම වටිනාකම් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| අයිතමය | වටිනාකම |
|---|---|
| | රු. |
| (අ) ලැබිය යුතු ආදායම් | 14,125,829 |
| (ආ) ගෙවිය යුතු තැන්පතු | 13,642,118 |
| එකතුව | 27,767,947 |

1.2.5 **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

---------------------------------------------------------

පහත අවස්ථා නිරීක්ෂණය විය.

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 29 (ඇ) 29(ඉ) ප්‍රකාරව පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම විශ්වවිද්‍යාලයක එක් ක්‍රියාකාරකමක් විය යුතු අතර මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක පීඊ/1/174/1 - 2003 හා 2003 ජනවාරි 29 දිනැති ලිපියෙන් දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගතයුතු නමුත් එයට පටහැනිව රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 380 යොදාගනිමින් පශ්චාත් උපාධි පාඨමාලා ආදායමින් රු.3,762,405 ක්ද කෙටිකාලීන පාඨමාලා ආදායමින් රු.264,624 ක්ද සමාලෝචිත වර්ෂය තුල නිලධාරීන්ට ගෙවා තිබුණි.

(ආ) අංක 38/89 (III) හා 1995 ඔක්තෝබර් 10 දිනැති, රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන්ට භාෂා ප්‍රවීනතා දීමනාව ගෙවිය නොහැකි බව රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක පීඊ/1/174/11(බී) හා 1998 මාර්තු 10 දිනැති ලිපියෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වෙත දන්වා ඇති බැවින්, වහාම ක්‍රියාත්මක වන පරිදි විශ්වවිද්‍යාල පද්ධතියේ සියළු කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන භාෂා දීමනාව නතර කිරීමට පියවර ගන්නා මෙන් තෘතියික අධ්‍යාපන හා පුහුණු කිරීමේ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 7/12/1/යූජ්සී/2 දරන ලිපියෙන් 2003 ජූලි 01 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කර තිබුණි. නමුත් , එම විධිවිධාන නොසලකා හැර සමාලෝචිත වර්ෂය තුල

විශ්වවිද්‍යාලය විසින් භාෂා දීමනා වශයෙන් රු.953,600 ක් නිලධාරීන් වෙත ගෙවා තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා දායක මුදල් ගෙවීමේදී අධ්‍යයන දීමනාව සැලකිල්ලට නොගත යුතු බව අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක බී/ඩී/අයිඑන්එස්/සීඑල්යූඑස්-ජ/078 හා 2003 ජූලි 18 දිනැති ලිපියෙන් දන්වා තිබියදීත් , එම දායක මුදල් ගෙවීමේදී ඊට පටහැනිව ක්‍රියාකිරීම නිසා 2010 වර්ෂයට අදාලව විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට රු.2,854,929 ක් සහ සේවක භාරකාර අරමුදලට රු.570,986 ක් වශයෙන් වැඩිපුර දායක මුදල් ගෙවා තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නේවාසිකාගාරය ඇතුළු විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවලින් වූ මූල්‍ය ප්‍රතිඵලය , පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය හා ක්‍රමක්ෂය ගණන් ගැනිමට පෙර රු.946,766,058ක ඌනතාවයක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වූ ඌනතාවය රු.934,282,325 ක් විය. කෙසේ වුවද , සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.773,200,000 ක් වූ රජයේ ප්‍රදානය හා රු. 134,130,854 ක ක්‍රමක්ෂය හේතුකොටගෙන එම ඌනතාවය රු.39,435,204 ක් දක්වා අඩු වී තිබුණු අතර , ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.717,900,000 ක් ව රජයේ ප්‍රදානය හා රු. 112,917,212 ක් වූ ක්‍රමක්ෂය හේතුකොටගෙන එම ඌනතාවය රු.93,465,117 ක් දක්වා අඩුවී තිබුණි.

#### 2.1.2 මූල්‍ය කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උපදේශන සේවා සංචිත අරමුදලේ වූ රු.24,289,080 ක් ජංගම ගිණුමක රඳවා තිබූ අතර එම මුදල් ආයෝජනය කර පොළී ආදායමක් උපයා ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම වෙනුවෙන් නිකුත් කරන ලද රු.35,000,000 ක චෙක්පත් බැංකුගත කිරීමේ ප්‍රමාදවීම නිසා රු.300,000 ක පොලී ආදායමක් අහිමි වී තිබුණි.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

### 2.2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වරිපනම් බදු ගෙවීම සම්බන්ධයෙන් දේපලක අයිතිය වෙනස් වී සති 08 ක් ඇතුලත ඒ බව අදාල පළාත් පාලන ආයතනයට දැනුම් දී නව අයිතිය ලේඛනගත කරවාගතයුතු වුවත් වර්ෂ කිහිපයකට පෙර මිලදී ගත් ගොඩනැගිලි හා දේපල 07 ක අයිතිය විශ්වවිද්‍යාලයට පවරා නොගෙන පෙර අයතිකරුගේ නමින් වරිපනම් ගෙවා තිබුණි.

(ආ) සනාතන පර්යේෂණ කමිටුව මගින් නිර්දේශ කර රු.22,924,500 ක මුදල් ප්‍රතිපාදනය කරන ලද පර්යේෂණ 77 ක් නිම කළයුතු කාලය ඉකුත් වී තිබුණද, අදාල පර්යේෂණ මේ දක්වා නිම කර නොතිබුණි.

### 2.2.2. කාර්යසාධනය

(අ) සමාලොචිත වර්ෂයේ සේවයේ නියුක්තව සිටි ස්ථිර කථිකාචාර්යවරු සංඛ්‍යාව පීඨ වශයෙන් හා එක් කථිකාචාර්යවරයෙකුට අදාල ශිෂ්‍ය සංඛ්‍යාව පහත පරිදි වේ.

| | ඉංජිනේරු පීඨය | තොරතුරු තාක්ෂණ පීඨය | වාස්තු විද්‍යා පීඨය |
|---|---|---|---|
| ස්ථිර කථිකාචාර්යවරු සංඛ්‍යාව | 218 | 21 | 70 |
| පීඨයේ ශිෂ්‍ය සංඛ්‍යාව | 3105 | 395 | 1202 |
| එක් කථිකාචාර්යවරයෙකුට අදාල ශිෂ්‍ය සංඛ්‍යාව | 14 | 18 | 17 |

I රසායන හා සැකසුම් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය තුල ස්ථිර කථිකාචාර්යවරු ගණන 12 ක් හා බාහිර කථිකාචාර්යවරු ගණන 23 ක් විය. ඒ නිසා කථිකාචාර්යවරු සංඛ්‍යාවෙන් 65% ක් බාහිර කථිකාචාර්යවරු විය.

II පරිගණක විද්‍යා සහ ඉංජිනේරු විද්‍යා දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය තුල ස්ථිර කථිකාචාර්යවරු ගණන 16 ක් හා බාහිර කථිකාචාර්යවරු ගණන 52 ක් විය. ඒ නිසා කථිකාචාර්යවරු සංඛ්‍යාවෙන් 76% ක් බාහිර කථිකාචාර්යවරු විය.

III යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ස්ථිර කථිකාචාර්යවරු ගණන 22 ක් වූ අතර බාහිර කථිකාචාර්යවරු ගණන 31 ක් විය. ඒ නිසා කථිකාචාර්යවරු සංඛ්‍යාවෙන් 58% ක් බාහිර කථිකාචාර්යවරු විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ශිෂ්‍ය තොරතුරු පහත පරිදි විය.

| | ඉංජිනේරු පීඨය | තොරතුරු තාක්ෂණ පීඨය | වාස්තු විද්‍යා පීඨය |
|---|---|---|---|
| බඳවාගත් උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව | 812 | 135 | 297 |
| පිටවූ උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව | 697 | 28 | 268 |
| රැඳී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 3105 | 395 | 1202 |

I සමාලෝචිත වර්ෂයේ සේවයේ නියුක්තව සිටි ස්ථිර කථිකාචාර්යවරු සංඛ්‍යාව 309 ක් වූ අතර එක් කථිකාචාර්යවරයෙකු සඳහා වූ සාමාන්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව 15 ක් විය.

II සමාලෝචිත වර්ෂය තුළ මහපොළ ශිෂ්‍යත්ව ආධාර වශයෙන් ශිෂ්‍යයින් 2365 කට රු.7,939,600 ක් ගෙවා තිබූ අතර ශිෂ්‍යාධාර වශයෙන් ශිෂ්‍යයින් 1466 කට රු. 9,392,700 ක් ගෙවා තිබුණි.

III සමාලෝචිත වර්ෂයේ ක්ෂය කිරීම් හැර පුනරාවර්තන වියදම රු. 810,625,738 ක් වීම නිසා ඒක ශිෂ්‍ය පිරිවැය රු.172,400 ක් වී තිබුණි.

IV සමාලෝචිත වර්ෂය තුළ උපාධි අපේක්ෂකයින් 881 කට හා උපාධි අපේක්ෂිකාවෝ 240 කට නේවාසිකාගාර පහසුකම් සලසා තිබූ අතර නේවාසික වියදම රු.628,371 ක් වී තිබුණි.

V තොරතුරු තාක්ෂණ පීඨයේ සමාලෝචිත වර්ෂයේ විභාග අසමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව 21% ක් වී තිබුණි.

**2.2.3 අයවැය ලේඛනමය පාලනය**

------------------------------

අයවැයගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් වූයෙන් අයවැය ලේඛණය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3. පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින් වර උපකුලපතිවරයා වෙත යොමු කරන ලදී . පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) අත්තිකාරම් ගෙවීම හා පියවීම
(ආ) පශ්චාත් උපාධි පාඨමාලා ආදායම්
(ඇ) ණය අයකිරීම
(ඈ) ලෙජර පැවැත්වීම
(ඉ) අයවැය පාලනය
(ඊ) ගිවිසුම් කඩකිරීම්
(උ) පර්යේෂණ
(ඌ) උපයෝගී ලේඛන